ස්විට්සර්ලන්තයේ, වෙලිසලෙන්, 8304, කුමගසේ 5 හි ස්ථිර පදිංචි දැනට සිංහරූපාගම, බෙන්තොට හි පදිංචි ගෙනියුක්ස් රෝලන්ඩ් හෙවත් රෝලන්ඩ් ගෙනියුක්ස් වන මා විසින් අත්සන් කර කොළඹ නොතාරිස් එම්. ඒ. උදේනි ප්‍රියදර්ශනී විසින් වර්ෂ 2014ක් වූ මැයි මස 2 වැනි දින ලියා සහතික කරන ලද අංක 268 දරන ඇටර්නි බලපත්‍රය මගින් සිංහරූපාගම, බෙන්තොට හි පදිංචි ජා. හැ. අං. 463182965 වී දරන තල්පෙ ලියනගේ චන්ද්‍රපාල යන අය වෙත දෙන ලද බලය මෙයින් අවලංගු කරන බවත් මින් ඉදිරියට ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තක් සම්බන්ධව මාගේ වගකීමක් නොමැති බවත් මෙයින් ප්‍රකාශ කරමි.

ගෙනියුක්ස් රෝලන්ඩ් හෙවත් රෝලන්ඩ් ගෙනියුක්ස්.

11-141

**සීමිත වගකීම් සහිත සමාගමක ප්‍රකාශකළ ප්‍රාග්ධනයේ යෝජිත අවකරණය පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 59(2) වගන්තියේ දක්වා ඇති නියමයන්ට අනුව දැන්වීම පහත දැක්වේ.

සමාගමේ නම : ටී කේ එස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 70880
සමාගමේ ලියාපදිංචි ලිපිනය : 4 වන මහල, අංක 245, ධර්මපාල මාවත, කොළඹ 7
අවකරණයට පෙර ප්‍රකාශ කළ ප්‍රාග්ධනය : රු. 350,000,020
අවකරණයට පසු ප්‍රකාශ කළ ප්‍රාග්ධනය : රු. 100,000,000
අවකරණය කළ ප්‍රමාණය : රු. 250,000,020

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

කේ ඩී එස් බී පී මඩප්පුලි,
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්.
සමාගම් ලේකම්.

2014 ඔක්තෝබර් මස 02 වැනි දින,
අංක 106/ඒ ලේඩි ද සොයිසා ඩ්‍රයිව්,
ලුනාව,
මොරටුව.

11-142

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන වෙළඳ සමාගම් ආඥාපනතේ 9 (i) ඡේදය අනුව මෙයින් දන්වා සිටින වග නම්,

වෙළඳ සමාගමේ නම : නාමල් බාලචන්ද්‍ර ක්‍රියේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 101423
ලියාපදිංචි කළ දිනය : 2014.10.13
ලියාපදිංචි කාර්යාලය : වඳුරාමුල්ල වත්ත, කිරිබේරිය පාර, පානදුර.

අධ්‍යක්ෂකවරු.

11-167

**ප්‍රසිද්ධ නිවේදනයයි**

නෙක්සස් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගම

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 242(1) වගන්තිය ප්‍රකාරව (සමාගම් ලියාපදිංචි අංක පී වී 47 දරන) ජේකේ මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගම සමග (සමාගම් ලියාපදිංචි කිරීමේ අංක පී වී 33 දරන) නෙක්සස් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගම ඒකාබද්ධ කිරීම සඳහා වූ යෝජිත ඒකාබද්ධ කිරීම පිළිබඳව එම පනතේ 242 (3) (ආ) වගන්තිය යටතේ කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනයයි.

ජේකේ මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගමට සෘජුව අයත් අනුබද්ධ සමාගමක් වන නෙක්සස් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහ ජේකේ මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගමෙහි හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2014.09.30 වැනි දින අත්සන් කිරීමට යෙදුණු වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 242(1) වගන්තිය ප්‍රකාරව ජේකේ මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගම සමග නෙක්සස් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගම ඒකාබද්ධ කිරීම සඳහා වූ යෝජනා සම්මුතීන් අනුව නෙක්සස් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගමෙහි පැවැත්ම අවසන් වන අතර ජේකේ මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගම තවදුරටත් පවතිනු ඇත.

මෙම නිවේදනයේ සිට වැඩ කරන දින 20කට නොඅඩු කාලයකට පෙර සහ පනතේ 243 වැනි වගන්තියේ දක්වා ඇති ලේඛනය ද සමග ඒකාබද්ධ කිරීමේ යෝජනා සම්මුතිය ලියාපදිංචි කිරීම පිණිස සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත නෙක්සස් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගම සහ ජේකේ මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගම විසින් භාරදීමෙන් අනතුරුව පනතේ 244(1) වන වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කිරීමේ සහතිකයක් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කිරීම මත ඒකාබද්ධ කිරීම බලාත්මක වනු ලැබේ.

පනතේ 242 (4) වගන්තිය ප්‍රකාරව අනුමත කරන ලද ඒකාබද්ධ කිරීමේ යෝජනාවක් ඉන් සජ්ජිත වන්නේ යයි සලකනු ලබන නෙක්සස් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගමෙහි සහ ජේකේ මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද යෝජනා සම්මුතීන් හි පිටපත් සමාගමේ යම් කොටස්කරුවකුගේ හෝ යම් ණය හිමියකුගේ හෝ සමාගම යම් බැඳියාවක් දරන්නා වූ සෙසු යම් පුද්ගලයෙකුගේ පරීක්ෂාව පිණිස කොළඹ 02, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ, අංක 117 දරන ස්ථානයේ පිහිටි කීල්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගමේ, ලේකම්වරුන්ගේ ලියාපදිංචි කාර්යාලයේ දී සාමාන්‍ය රාජකාරි වේලාවන්හි දී තිබෙනු ඇත.

ඒ වෙනුවෙන් සමාගම වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන සමාගමේ යම් කොටස්කරුවකුට ණය හිමියකුට හෝ සමාගම යම් බැඳියාවක් දරන්නාවූ යම් පුද්ගලයකුට ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ගාස්තු රහිතව ලබාගැනීමේ හිමිකමක් ඇත.

නෙක්සස් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගම,

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කීල්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

2014 ක් වූ ඔක්තෝබර් මස 07 වැනි දින දී ය.

11-168

**සීමිත වගකීම් සහිත සමාගමක ප්‍රකාශිත ප්‍රාග්ධන අවකරණය පිළිබඳ මහජන දැන්වීමයි**

2011 වසරේ අංක 3 දරන සංශෝධන සහිත 2000 වසරේ අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතේ රෙගුලාසි සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය මගින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව සංයුක්ත රක්ෂණ සමාගමක් මගින් රක්ෂණ ව්‍යාපාරයක් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ලෙස විසංගමනය කිරීම සඳහා අවකරණයන් සිදු කළ යුතු ය.

ඊට අදාළව 2007 වසරේ අංක 7 දරන සමාගම් පනතේ 59(2) දරන වගන්තියේ නියමන්ට අනුකූලව මෙම නිවේදනය නිකුත් කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත LOLC ඉන්ෂුවරන්ස් සමාගම
සමාගම් අංකය : පී. බී. 3807
දැනට ප්‍රකාශිත ප්‍රාග්ධනය : රු. 950,000,000
ප්‍රකාශිත ප්‍රාග්ධනය (2014 නොවැම්බර් මස 30) : රු. 1000,000,000
අවකරණයෙන් පසු ප්‍රකාශිත ප්‍රාග්ධනය : රු. 500,000,000
අවකරණය වලංගු වන දිනය : 2015 ජනවාරි 01 වැනි දින.

සංයුක්ත රක්ෂණ ව්‍යාපාරයේ අබන්ධ මෙහෙයුම් සඳහා 2014 වසරේ නොවැම්බර් මස 30 වැනි දා වන විට තවත් රුපියල් මිලියන 50 ක වැඩිවීමක් අවශ්‍ය වනු ඇත. අවකරණය ඉහත විසංගමනයට අනුකූලව ක්‍රියාත්මක වේ.

සීමාසහිත LOLC ඉන්ෂුවරන්ස් සමාගම

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

LOLC කෝපරේට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

2014 ඔක්තෝබර් මස 31 වැනි දින,
අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

11-170

---

## පොදු නිවේදනය

### සීමාසහිත සමාගමක් සංස්ථාගත කිරීම

"එස් ඇන්ඩ් ටී ඉන්ටීරියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" 2014 සැප්තැම්බර් මස 25 වැනි දින සංස්ථාගත කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 ඡේදයේ නියමයන් අනුව මින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නාමය : එත් ඇන්ඩ් ටී ඉන්ටීරියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 100841
ලියාපදිංචි කාර්යාලය : අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10
සංස්ථාගත කළ දිනය : 2014 සැප්තැම්බර් මස 25 වැනි දින.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි.

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2014 ඔක්තෝබර් මස 21 වැනි දින,
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10

11-174

## ඒකාබද්ධ කිරීමේ නිවේදනය

### ඇසට්ලයින් ලීසිං කම්පනි ලිමිටඩ් සමඟ ලිස්වින් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (03) වගන්තිය යටතේ ඇසට්ලයින් ලීසිං කම්පනි ලිමිටඩ් සහ ලිස්වින් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් යන සමාගම් ඒකාබද්ධ කරන ලද බවට සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් තුමා විසින් 244 (1) ඒ වගන්තිය යටතේ ඒකාබද්ධ කිරීමේ සහතිකය වර්ෂ 2014ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින නිකුත් කරන ලදී.

ඒකාබද්ධ සමාගමේ නම : ඇසට්ලයින් ලීසිං කම්පනි ලිමිටඩ්
ඒකාබද්ධ සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 75, හයිඩ් පාර්ක් කෝනර්, කොළඹ 02
ඒකාබද්ධ කිරීමේ දිනය : 2014 ඔක්තෝබර් මස 10 වැනි දින
ඒකාබද්ධ සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 82

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

ඇසට්ලයින් ලීසිං කම්පනි ලිමිටඩ්.
සමාගම් ලේකම්.

11-177

---

## දැන්වීමයි

පෞද්ගලික සීමිත සමාගමක් 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

සමාගමේ නම : හෙරිටේජ් එකෝ රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 100366
සංස්ථාගත කළ දිනය : 2014.08.19
ලියාපදිංචි ලිපිනය : අංක 28/6, දේවානන්ද පාර, නාවින්න, මහරගම.

සමාගම් ලේකම්.

11-178

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

එංගලන්තයේ, ඩබ්ලිව්. සී. 2 ඒ. 3. ඊ. ඊ. (WC2A 3EE) ලින්කන්ස් ඉන් ෆීල්ඩ්ස් හි අංක 29 දරන ස්ථානයේ පිහිටි වරලත් සහතිකලත් ගණකාධිකාරි ආයතනයෙහි (Association of Chartered Certified Accountants – "ACCA") ප්‍රධාන විධායක නිලධාරිනිය වන හෙලන් ජෝ ඇනා බ්‍රැන්ඩ් වන මා විසින් 2012 ජූලි මස 05 වැනි දින එංගලන්ත නොතාරිස් ඇග්නස් කෝර්ලස් මහත්මිය විසින් එංගලන්තයේ දී අත්සන් තබන ලද දින පොත් අංක 13 යටතේ ඇටෝර්නි බලපත්‍ර පොතේ 7256 කාණ්ඩයේ 34 පත් තීරුවේ ලියාපදිංචි කළ ඇටෝර්නි බලපත්‍රයේ බලකරුවන් ලෙස නම් කළ කොළඹ 3, ආර්. ඒ. ද මෙල් මාවතේ අංක 424 හි ඇන් සේනානායක නිලූෂා රණසිංහ නොහොත් නිලූෂා ඇන් සේනානායක හා ඕස්ට්‍රේලියාව 2000, නිව්සවුත් වේල්ස්, යෝර්ක් පාරේ, අංක 68, 402 සුයිට් හි ලුසියා රියල් මාර්ටින් මහත්මීන් හට දී ඇති ඇටෝර්නි බලපත්‍රය, ACCA හි සිදු වූ අන්තර්ජාතික ප්‍රතිපත්තිවල වෙනස්කම් හේතුකොට ගෙන මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ලංකා වාසී සියලු ජනතාවගේ දැන ගැනීම පිණිස මෙයින් ප්‍රකාශ කර සිටිමි.

නිලූෂා ඇන් සේනානායක රණසිංහ මහත්මිය හට නව ඇටෝර්නි බලපත්‍රයක් යටතේ ACCA ආයතනයෙහි වර්තමාන බලකරු වශයෙන් කටයුතු කිරීමට සියලු බලතල ලබා දී ඇති බව මම තවදුරටත් ප්‍රකාශ කර සිටිමි.

හෙලන් ජෝඇනා බෑන්ඩ්.

11-183

---

## ඒකාබද්ධ කිරීමේ නිවේදනය

### මුතුගල එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

කොළඹ 10, ටී. බී. ජයා මාවතේ අංක 481 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන සමාගම් ලියාපදිංචි අංක PV 936 දරන මුතුගල එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොළඹ 10, ටී. බී. ජයා මාවතේ අංක 481 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ලියාපදිංචි අංක පීබී 1183 යටතේ ලියාපදිංචි කර ඇති බ්‍රවුන්ස් හෝල්ඩින්ස් ලිමිටඩ් සමග ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් 2007 අංක 7 දරන සමාගම් පනතේ හි VIII කොටස යටතේ ඇති විධිවිධානවලට අනුකූලව කෙරෙන සමාගම් ඒකාබද්ධ කිරීමේ යෝජනාව සම්බන්ධවයි.

බ්‍රවුන්ස් හෝල්ඩින්ස් ලිමිටඩ් සමග පතිරගල එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ඒකාබද්ධ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති යෝජනාව 2014 නොවැම්බර් මස 25 වැනි දින සිට බලාත්මක වන බවට මෙයින් ප්‍රසිද්ධ නිවේදනයක් කරන අතර ඒකාබද්ධ කරනු ලබන සමාගම වන පතිරගල එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් , අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව ඒකාබද්ධ කිරීම සමාගමේ උපරිම යහපත සඳහා වන බවත් සහ එකාබද්ධ කිරීම බලාත්මක වීමෙන් ඉක්බිතිව ඒකාබද්ධිත සමාගම (බ්‍රවුන්ස් හෝල්ඩින්ස් ලිමිටඩ්) මූල්‍ය ස්ථායිතාවය පිළිබඳ පරීක්ෂණයෙන් සමත් වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වන බවත්,

ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් ඒකාබද්ධ කරනු ලබන සමාගමේ (පතිරගල එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යම් කොටස් හිමියකු හෝ ණයහිමියෙකු හෝ ඒකාබද්ධ කරනු ලබන සමාගමේ බැඳීමකට යටත් වී ඇති යම් තැනැත්තෙකු හෝ විසින් පරීක්ෂාකර බැලීම සඳහා කොළඹ 10, ටී. බී. ජයා මාවතේ අංක 481 දරන ස්ථානයේ පිහිටා ඇති එකී සමාගමේ ලියාපදිංචි කාර්යාලයෙන් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර කාර්යාල වේලාවන්හි එනම් පෙ. ව. 8.00 සිට ප. ව. 5.00 දක්වා ගෙවීමකින් තොරව ලබාගත හැකි බවත් මෙසේ දන්වා සිටිමි.

අධ්‍යක්ෂක මණ්ඩලය.

මුතුගල එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ
බ්‍රවුන්ස් හෝල්ඩින්ස් ලිමිටඩ්.

2014 ඔක්තෝබර් මස 20 වැනි දින දී ය.

11-186

---

## ඒකාබද්ධ කිරීමේ නිවේදනය

### පතිරගල එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

කොළඹ 10, ටී. බී. ජයා මාවතේ අංක 481 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන සමාගම් ලියාපදිංචි අංක පී වී 414 දරන පතිරගල එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමටඩ්, කොළඹ 10, ටී. බී. ජයා මාවතේ අංක 481 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ලියාපදිංචි අංක පීබී 1183 යටතේ ලියාපදිංචි කර ඇති බ්‍රවුන්ස් හෝල්ඩින්ස් ලිමිටඩ් සමග ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් 2007 අංක 7 දරන සමාගම් පනතේ හි VIII කොටස යටතේ ඇති විධිවිධානවලට අනුකූලව කෙරෙන සමාගම් ඒකාබද්ධ කිරීමේ යෝජනාව සම්බන්ධවයි.

බ්‍රවුන්ස් හෝල්ඩින්ස් ලිමිටඩ් සමග පතිරගල එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ඒකාබද්ධ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති යෝජනාව 2014 නොවැම්බර් මස 25 වැනි දින සිට බලාත්මක වන බවට මෙයින් ප්‍රසිද්ධ නිවේදනයක් කරන අතර ඒකාබද්ධ කරනු ලබන සමාගම වන පතිරගල එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් , අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව ඒකාබද්ධ කිරීම සමාගමේ උපරිම යහපත සඳහා වන බවත් සහ එකාබද්ධ කිරීම බලාත්මක වීමෙන් ඉක්බිතිව ඒකාබද්ධිත සමාගම (බ්‍රවුන්ස් හෝල්ඩින්ස් ලිමිටඩ්) මූල්‍ය ස්ථායිතාවය පිළිබඳ පරීක්ෂණයෙන් සමත් වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වන බවත්,

ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් ඒකාබද්ධ කරනු ලබන සමාගමේ (පතිරගල එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යම් කොටස් හිමියකු හෝ ණයහිමියෙකු හෝ ඒකාබද්ධ කරනු ලබන සමාගමේ බැඳීමකට යටත් වී ඇති යම් තැනැත්තෙකු හෝ විසින් පරීක්ෂාකර බැලීම සඳහා කොළඹ 10, ටී. බී. ජයා මාවතේ අංක 481 දරන ස්ථානයේ පිහිටා ඇති එකී සමාගමේ ලියාපදිංචි කාර්යාලයෙන් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර කාර්යාල වේලාවන්හි එනම් පෙ. ව. 8.00 සිට ප. ව. 5.00 දක්වා ගෙවීමකින් තොරව ලබාගත හැකි බවත් මෙසේ දන්වා සිටිමි.

අධ්‍යක්ෂක මණ්ඩලය,

පතිරගල එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ
බ්‍රවුන්ස් හෝල්ඩින්ස් ලිමිටඩ්.

2014 ඔක්තෝබර් මස 20 වැනි දින දී ය .

11-187

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කඩවත, පහළ කරගහමුණ, අංක 211/03 දරන ස්ථානයේ පදිංචි පුස්සැල්ලගේ බර්නඩෙත් සන්ධ්‍යා කුමාරි සිල්වා වන මම ප්‍රසිද්ධ නොතාරිස් තිස්ස එච්. විමලවීර ලියා සහතික කළ අංක 9633 සහ 2011.08.20 වැනි දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් කඩවත, පහළ කරගහමුණ, අංක 211/1 දරන ස්ථානයේ පදිංචි පුස්සැල්ලගේ වාසනා නිරෝෂන් කැනීසියුස් සිල්වා යන අය හට දෙන ලද ඇටර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

11-197

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ඩී එෆ් සී සී බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වන වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළක් සහ යන්ත්‍රෝපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

*අංක 6247, 3074, 6680 සහ 3622 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර*

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ දේවමැද්දේ කෝරළේ, වහන්තරේ ග්‍රාමයේ පිහිටි, නාරංගහමුලවත්ත, හෙවත් කහටගහමුලවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු ආරියදාස අතපත්තු විසින් සාදන ලද, 2009 මාර්තු මස 08 වැනි දිනැති අංක 33/2009 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය. .

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 01, පර්. 37
එහි පිහිටි පස, වගාවන්, ගොඩනැගිලි, සහ සියල්ල සහිතව

ඉහත දැක්වෙන්නේ බලයලත් මිනින්දෝරු කේ. සිවඥානසුන්දරම් විසින් සාදන ලද 1977 ජූලි මස 25 වැනි දිනැති අංක 2378 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස දැක්වෙන ඉඩමේ නැවත මිනුමකි.

උකස්කරුට සහ ඔහුගේ අමුත්තන් ඉංජිනේරුවන්, කොන්ත්‍රාත්කරුවන්, ගෘහ නිර්මාණ ශිල්පීන් කුලී කරුවන් සේවකයන්, බදුකරුවන් බලපත්‍රලාභීන් ආරාධිතයන් යන අයට සියලුම අවස්ථාවල සහ මින්මතුවට ඔවුන්ගේ කැමැත්ත සහ අවශ්‍යතාවය අනුව, ඕනෑම අරමුණක් සඳහා, දිවා කාලයේ හෝ රාත්‍රි කාලයේ යාමට ඒමට පසු කිරීමට ඇවිදිමින් හෝ වෙනයම් ආකාරයකින් ඔවුන්ගේ අශ්වයන්, ගවයන් හෝ වෙනත් සතුන් මගින් හෝ මෝටර් කාර්රථ, ලොරි රථ මගින් හෝ වෙනත් වාහනයක් මගින් බර පැටවූ හෝ බර නොපටවා පාර දිගේ හෝ පාර මතින් මෙහි විශේෂයෙන් විස්තර කර ඇති සහ එක් ආකාරයක හෝ සියලුම ආකාරයේ අයිතීන් දිශාවන්, වාසීන් සහ අනුබැඳි දේපළ හෝ සාමාන්‍ය පරිභෝජනයේ දී භාවිතා වන සතු කරගන්නා සියලුම අයිතීන් සඳහා සම්පූර්ණ සහ නිදහස් අයිතියක් ඇති අතර එම කොටසේ විදුලි කේබල් ඇදීමට ඉහලින් යන වයර් ඇදීමට ජලාපවහන සහ ගෑස් හෝ නළ ජලය සඳහා අදාළ කොටස් සවිකිරීමට සහ වෙනත් ඕනෑම ආකාරයක ක්‍රියාවක් හෝ ඒ සඳහා උත්සාහයට සම්පූර්ණ අයිතියක් ඇත.

පහත විස්තර කෙරෙන යන්ත්‍රෝපකරණ ද සමග -

| *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|
| ඩ්‍රයර් | 01 |
| බොයිලර් | 01 |
| මිලින්ග් මැෂින් | 01 |
| එලිවේටර් | 02 |

වාරියපොල වහන්තරේ එච්. එම්. ඩී. කේ. හාල්මෝල හි පිහිටි අනෙකුත් යන්ත්‍රෝපකරණ සමග.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී එස් අයි වැත්තෑව විසින් සහතික කරන ලද 2011 අප්‍රේල් මස 01 වැනි දිනැති අංක 6247, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ගිලීෂියන් පෙරේරා විසින් සහතික කරන ලද 2011 ජූනි මස 20 වැනි දිනැති අංක 3074, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී එස් අයි. වැත්තෑව විසින් සහතික කරන ලද, 2011 නොවැම්බර් මස 16 වැනි දිනැති අංක 6680 සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ගිලීෂියන් පෙරේරා විසින් සහතික කරන ලද, 2012 නොවැම්බර් මස 22 වැනි දිනැති අංක 3622 දරන උකස්කරයන් ප්‍රකාර, වාරියපොළ වහන්තරේ එච් එම් ඩී කේ හාල්මෝල නම් තනි පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන බාලසූරිය මුදියන්සේලාගේ කුමාරතිලක විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2014 නොවැම්බර් මස 27 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. ගැණුම් මිලෙන් වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 86,000ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 122 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

11-132

**ජාතික ඉතිරිකිරීමේ බැංකුව**
**පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වන වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

*අංක 8136 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත් කුරු කෝරලේ, දූනගහ පත්තුවේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මහ නගර සභා සීමාවට අයත් පලගතුරේ ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 75 ඒ, පලගතුරෙර බටහිර පිහිටි අංක 351 පෝරුතොට පාර යන ලිපිනය දරන පයුරුගහවත්ත සහ දොඹගහවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. මෙන්ඩිස් විසින් සාදන ලද 2008 පෙබරවාරි මස 08 වැනි දිනැති අංක 4127/ඒ දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 01, රූඩ් 03, පර්. 12.2
එහි පිහිටි ගස්වැල් වගාවන් සහ සියල්ල සහිතව

ඉහත කී අංක 4127/ඒ දරන පිඹුරට අනුව සහ පත්තිරු සහ වෙළුම් E 1030/48 යටතේ (G 09/20 ලෙස ඉදිරියට ගෙන යන ලද) මීගමුව ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් සාදන ලද 1992 පෙබරවාරි මස 12 වැනි දිනැති අංක 194 දරන පිඹුරේ ලොට් අංක 12 ලෙස (මාර්ගය සඳහා වෙන් කිරීම) දැක්වෙන මාර්ගය භාවිතා කිරීමේ අයිතිය ද සමග.

*දේපළ වෙත පිවිසීම.* - කොළඹ සිට මහනුවර A 1 ප්‍රධාන පාරේ කැලණිය පාලම පසුකර වම් පසට පෑලියගොඩ පුත්තලම ප්‍රධාන පාර පිහිටා ඇත. මෙම පාරේ කිලෝමීටර් 31.4ක් ගියපසු පෙරියමුල්ල මංසන්ධිය හමුවේ. එතැනින් වමට කිලෝමීටර් 1.6ක් දුරින් අඩිනිවාස් පාර සහ කනත්ත පාර පසුකර ලිවිස් ප්ලේස් හමුවේ. ලිවිස් ප්ලේස් සහ පෝරුතොට පාරේ (කොච්චිකඩේ දෙසට) කිලෝමීටර් 2.4ක් දුරින් අදාළ දේපළ දකුණු පසින් පිහිටා ඇත. එම ස්ථානය හරියටම මීගමුව නගරයේ සිට කිලෝමීටර් 4.3ක් සහ කොළඹ සිට කිලෝමීටර් 41.4ක් දුරින් පිහිටා ඇත.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවට සහ පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී ට හොනර්ස් ක්ලබ් ඉන්ටර්නැෂනල් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ අප විසින් 2014 නොවැම්බර් මස 25 වැනි දින (අඟහරුවාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25%ක් (සියයට විසිපහක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50% ක් (සියයට පනහක්),
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000,
7. ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

තීරණය පිළිබඳ දැන්වීම් සඳහා 2014.10.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2014.10.24 වැනි දින දිනපතා පුවත්පත් වන ඩේලි නිවුස්, දිනමිණ, තිනකරන්, ලක්බිම සහ සුඩර් ඔලි පුවත්පත් බලන්න.

වැඩි විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා කරුණාකර අමතන්න. සහකාර සාමාන්‍යාධිකාරී ආයතනික මූල්‍ය, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක 011 42577994.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකු සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 122 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

11-133

---

**හැටන් නැෂනල් බැංකුව පී එල් සී - වත්තල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසිය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ වත්තල මාබෝල ප්‍රාදේශීය සභා සීමාවේ කොට්ඨාස 2 හි වත්තල පරණ මීගමුව පාරේ අංක 129/1 දරන මදටියගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද 2010.09.28 දාතම හා අංක 10396 දරන පිඹුරෙන් නිරූපිත ලොට් පී වශයෙන් දක්වා ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස ප්‍රමාණයෙන් අක්. 0 රූ. 0 පර්. 23

*ඉඩමට ප්‍රවේශ මාර්ගය .*- කොළඹ සිට කොළඹ- මීගමුව පාරේ වත්තල කාගිල්ස් ෆුඩ් සිටි දක්වා පැමිණ දකුණු පස ඇති පරණ මීගමු පාරට පිවිස හැදල දක්වා පැමිණි විට පෑන් ඒෂියා බැංකුව ඉදිරිපස වම් අත පැත්තේ අදාළ දේපළ හමුවේ.

පී. ඩී. ආර්. අසංග පෙරේරා යන අයට ලබාදුන් මූල්‍ය පහසුකම් වෙනුවෙන් බැඳුම් කරුවන් වශයෙන් හැටන් නැෂනල් බැංකුව පී එල් සී වෙත උකස් කරනු ලද දේපළ 2014 දෙසැම්බර් මස 10 වැනි බදාදා ප. ව. 2.00 ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014 සැප්තැම්බර් මස 26 වැනිදා *රජයේ ගැසට් පත්‍රයද* 2014 සැප්තැම්බර් මස 30 වැනිදා ඩේලිමිරර් ලක්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීම් කරන පිළිවෙල*.- සාර්ථක ගැණුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතුයි.

1. ගැණුම් මිලෙන් සියයට 10%ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එක) දේශීය විකිණුම් බද්ද,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. වෙන්දේසිය සහතික කිරීම සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජයේ හෝ වෙනත් බල අධිකාරියක් මගින් පනවා ඇති වෙනත් ව්‍යවස්ථාපිත අය බදු තීරු බදු හෝ අයකිරීම් අදාල වේ නම් ඒවා ද සමග වෙන්දේසි දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපි ලේඛණ කොළඹ ටී බී ජයා මාවත, අංක 479 හැටන් නැෂනල් බැංකුව පී එල් සී සාමාන්‍යාධිකාරී (නැවත අයකර ගැනීම්) වෙතින් පරීක්ෂාකර බැලිය හැකිය.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරු.

අංක 146/3, කල්දේරා ගාඩ්න්ස් දුටුගැමුණු වීදියෙන් හැරී කොහුවල
දුරකථන අංක : 011 - 4302622 011- 4302623 ෆැක්ස් අංකය : 2856013.

11-171

---

## හැටන් නැෂනල් බැංකුව පී එල් සී - කඩුවෙල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසිය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, කඩුවෙල, කොළඹ පාරේ, වරිපනම් අංක 212/7 තිඹිරිගහවත්ත (කොටසක්) *නොහොත්* රක්ගහවත්ත *නොහොත්* ගොඩෙල්ලවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. බී. ප්‍රේමතිලක විසින් මැන සාදන ලද 2012.01.26 දාතම හා අංක 1868 දන පිඹුරෙත් නිරූපිත ලොට් 4 ඩී වශයෙන් දක්වා ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස ප්‍රමාණයෙන් අක්. 0 රූඩ් 1 පර්. 20.

*ඉඩමට ප්‍රවේශ මාර්ගය* .- කඩුවෙල නගරයේ සිට කි. මී. 2ක් පමණ කොළඹ පාරේ පැමිණි විට හමුවන දකුණු අත පැත්තේ ඇති බොරළු පාරේ කි. මී. 50 පැමිණි විට එම පාරේ වම් අත පැත්තේ අදාළ දේපළ හමුවේ.

කංකානිගේ දොන් ගයාන් දිනේෂ් පෙරේරා යන අයට ලබාදුන් මූල්‍ය පහසුකම් වෙනුවෙන් බැඳුම්කරුවන් වශයෙන් හැටන් නැෂනල් බැංකුව පී එල් සී වෙත උකස් කරන ලද දේපළ 2014 දෙසැම්බර් මස 10 වැනි බදාදා පෙ. ව. 11.00 ට ආරම්භව පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2012 නොවැම්බර් මස 16 වැනිදා *රජයේ ගැසට් පත්‍රය* ද 2012 නොවැම්බර් මස 19 වැනිදා ඩේලිමිරර්, ලක්බිම සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීම් කරන පිළිවෙල*.- සාර්ථක ගැණුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතුයි.

1. ගැණුම් මිලෙන් සියයට 10%ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එක) දේශීය විකිණුම් බද්ද,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. වෙන්දේසිය සහතික කිරීම සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජයේ හෝ වෙනත් බල අධිකාරියක් මගින් පනවා ඇති වෙනත් ව්‍යවස්ථාපිත අය බදු තීරු බදු හෝ අයකිරීම් අදාල වේ නම් ඒවා ද සමග වෙන්දේසි දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපි ලේඛණ කොළඹ ටී බී ජයා මාවත, අංක 479 හැටන් නැෂනල් බැංකුව පී එල් සී සාමාන්‍යාධිකාරී (නැවත අයකර ගැනීම්) වෙතින් පරීක්ෂාකර බැලිය හැකිය.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරු.

අංක 146/3, කල්දේරා ගාඩ්න්ස් දුටුගැමුණු වීදියෙන් හැරී කොහුවල
දුරකථන අංක : 011 - 4302622 011- 4302623 ෆැක්ස් අංකය : 2856013.

11-179

---

## මහජන බැංකුව - කඩුවෙල ශාඛාව (196)

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වටිනා දේපළ දෙකක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### *උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ (වරිපනම් අංක 216 කඩුවෙල පාර) කොතලාවල යන ගම පිහිටි දාඹුගහවත්ත නමැති ඉඩම පර්චස් දහයයි දශම දෙකයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 10.20) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

ඉහත කී ඉඩම පහත සඳහන් ඉඩම නැවත මැන සාදන ලද්දකි. කඩුවෙල කොතලාවල යන ගම පිහිටි "දඹුගහවත්ත" නමැති බලයලත් මිනින්දෝරු ටී. එම්. විජේරත්න මහතා විසින් 1992.12.05 වැනි දින මැන සාදන ලද අංක 109 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් අංක 3 වූ අංක 109 දරන පර්චස් දොළහක (අක්. 0, රූඩ් 0, පර්. 12.0) විශාල ඉඩම සහ අනිකුත් සියලු දේ ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2014.11.28 වැනි දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා රජයේ *ගැසට් පත්‍රයේ* 2014.04.11 වැනි දින ද, ඩේලිනිව්ස් දිනමිණ 2014.07.11 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - කඩුවෙල නගර මධ්‍යයේ සිට මාලඹේ පාර (නව නුවර පාර) කි. මීටර් 1.5ක් ඉදිරියට පැමිණි විට පාරේ දකුණු පසට මායිම්ව රාජසිංහ මාවතට පිවිසෙන මාර්ගය අසල "බිලූ රෙස්ටුරන්ට්" එක පිහිටි ඉඩම මේ දේපළ වේ.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක් වන පළාත් අධිකාරී බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරුගේ හා නිවේදක ගාස්තු වශයෙන් රු. 500ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නුගේගොඩ, හයිලෙවල් පාරේ, අංක 177 ඒ හි පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත (කොළඹ පිටත) බටහිර කලාප II ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2768018, 2812260, ෆැක්ස් අංකය : 817737

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු හා
තක්සේරුකරු උසාවි කොමසාරිස්,
හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145,
0718021206.

11-165/1

**මහජන බැංකුව - මහරගම ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ උඩුගහ පත්තුවේ, සිද්ධමුල්ල යන ගම පිහිටි "අලුබෝගහවත්ත" නොහොත් "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක එස්. පී. ඇල්විටිගල මහතාගේ වර්ෂ 2006.12.17 වැනි දිනැති අංක 2810 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 දරන කැබැල්ල.

*ප්‍රමාණය* : පර්චස් අටක් (අ. 0 රූ. 0 පර්. 08) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

මාර්ග අයිතිය සඳහා "අලුබෝගහවත්ත" නොහොත් "දෙල්ගහවත්ත" ඉඩමේ මිනින්දෝරු එම්. ඒ. ජයරත්න මහතාගේ 2001.11.18 දිනැති 3392 දරන පිඹුරේ කැබලි අංක සී 1 බී වන මාර්ගය වන (අ. 0 රූ. 0 පර්. 3.60) ක් විශාල මාර්ග අයිතිය වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2014.11.26 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ *ගැසට් පත්‍රයේ* 2009.04.17 වැනි දින ද, දිනමිණ පුවත්පත්වල 2009.07.22 වැනි දින පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීම්වලට අවධාණය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - මහරගම හෝමාගම හයිලෙවල් පාරේ කොට්ටාව මංසන්ධියෙන් දකුණු අතට යන පිළියන්දල පාරේ (මාර්ග අංක 255) කි. මීටර් 3ක් පමණ ගිය විට දකුණු පසට ඇති ඇල්හේන පාර හමුවේ. එම පාරේ මීටර් 200 පමණ ගිය පසු දකුණු පසට ඇති අඩි 10ක් පමණ පළල ගුරු පාරක් හමුවේ. එම පාරේ මීටර් 15ක් පමණ ගිය විට පාරේ දකුණු පස පාරට මායිම්ව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියට බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරුගේ හා නිවේදක ගාස්තු වශයෙන් රු. 500ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත හයිලෙවල් පාර, නුගේගොඩ අංක 177 ඒ හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු (කොළඹ පිටත) ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2768018, 2812260

ඉහත සඳහන් ඉතිරි මුදල දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ එම දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු හා
තක්සේරුකරු උසාවි කොමසාරිස්,
හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145,
0718021206.

11-165/2

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මීගමුව දිසා අධිකරණයේ දී ය

ගම්පහ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වලව්වත්ත, කිඩගම්මුල්ල, ගම්පහ.

.................................පෙත්සම්කරු.

නඩු අංකය : 3331/එස්පීඑල්
වටිනාකම : රු. 983,532.00

එදිරිව

1. මැටරඹ කනත්තගේ කුමුදුනී,
අංක 34/පී/2, කල්දේරාවත්ත, කටාන.

2. කුරුවිට ආරච්චිගේ ඇඩ්වින් කිංස්ලි,
අංක 34/පී/2, කල්දේරාවත්ත, කටාන, සහ තවත් අය.

..............................වගඋත්තරකරුවෝ.

ඉහත නම් සඳහන් 1, 2 වගඋත්තරකරුවන් වෙතයි

මීගමුව දිසා අධිකරණයේ නඩු අංක 3331/ එස් පී එල් දරන නඩුවේ වර්ෂ 2014.01.07 වැනි දින මීගමුව දිසා අධිකරණයේ ගරු අතිරේක දිසා විනිසුරු තැන්පත් ආර්. පී. ඩී. පී. පී. රත්නායක මැතිතුමන් ඉදිරියේ දී සුදුස්සක් කිරීම සඳහා කැඳවූ අවස්ථාවේ දී පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ජේ. ඩී. ජේ. නිකුලස් මහතා පෙනී සිටියදී, විභාගයට ගෙන, ඉල්ලීම සලකා බලා, තීරක ප්‍රධනය අනුව අයකර ගතහැකි මුදල රු.619,285 ක මුදලක් ද, රුපියල් 476,800 ක මුදල මත 2010.06.07 දින සිට නඩු පවරනතෙක් 23% ක වාර්ෂික පොලියක් ද, නඩුව පැවරූ දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසාන වනතෙක්, නෛතික පොලිය ද, හිමි බවට තීරණය කරමි. මුදලින් ගෙවා ඇති මුදල අඩුකළ යුතු බවට ද, තීරණය කරමි. ඒ අනුව එම මුදල අයකර ගැනීම සඳහා පෙත්සමේ උපලේඛනගත දේපළ තහනමට ගෙන විකිණීමට අධිකරණයේ පිස්කල්වරයාට බලය පවරමින් තීන්දු කළ බවට අණකොට තීන්දු ප්‍රකාශ කරන ලදී.

එලෙස තීන්දු කරන ලද තීන්දුව අනුව, පළමුවන සහ දෙවන වගඋත්තරකරුවන් ක්‍රියාකිරීමට අපොහොසත් වි පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර එකී නිශ්චල දේපළ වර්ෂ 2014ක් වූ දෙසැම්බර් මස 22 වනි දින පෙ. ව. 10.30 ට එකී දේපළ පිහිටා ඇති කටාන, කල්දේරාවත්තේ, අංක 34/පී/2 දරන ස්ථානයේදී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුලු ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
2. තක්සේරු ගාස්තු 0.5ක් ද,
3. වෙන්දේසිය ගැසට් පත්‍රයේ පළකිරීමේ ගාස්තු,
4. පුවත්පත් දැන්වීම් සඳහා දරන ලද වියදම,
5. අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම ද,
6. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2.5% ක මුදලක් ද,
7. පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතු 1% ක ගාස්තුව ද,
8. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා වූ සියලු වියදම් ද,
9. රජයේ ෂවුන්ඩේජ් ගාස්තු ද,
10. ලිපිකරු හා සෝෂක ගාස්තු ද.

ගැණුම්කරු විසින් විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30ක් ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත්කළ යුතු ය.

### වෙන්දේසියට අදාල ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ දිසාවේ අළුත්කුරු කෝරළයේ දූනගහපත්තුවේ නැගෙනහිර කටානේ පිහිටි කැකුණගහවත්ත, මරදගහවෙල මූකලාන නොහොත් දවලගහ මූකලාන "වවුල්පොරේවත්ත නමැති ඉඩමට වෝල්ටර් ඒ ප්‍රනාන්දු බලයලත් මිනින්දෝරු තැන වර්ෂ 1989 ජූලි මස 8 වැනි දින මැන සාදන ලද අංක 4884/ඒ දරන පිඹුරේ අංක 24 දරන කොටස වන උතුරට : පාර ද, නැගෙනහිරට : අංක 23 දරන කොටස ද, දකුණට : අංක 4828/ඒ දරන පිඹුරේ අංක 32 දරන කොටස ද, බස්නාහිරට : පාර ද, මායිම් වූ පර්චස් දහ අටයි දශම අට (අ. 0 රූ. 0 පර්. 18.8) ක් හෙවත් හෙක්ටයාර් 0.048 ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු ආදී සියල්ල ද සමග මාර්ග අයිතිය ද වේ.

(පෙර ලියාපදිංචිය ඊ 1011/18 මීගමුව ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි වී ඇත)

අයි. සී. ඒ. පෙරේරා,
සාම විනිසුරු,
උසාවි කොමසාරිස්/වෙන්දේසිකරු/තක්සේරුකරු.

2014ක් වූ ඔක්තෝබර් මස 21 වැනි දින,
අංක 86,
නව නුවර පාර,
වැලිවේරිය.
දුරකථන අංක : 033 2255115
077 - 3698690
*වැඩි විස්තර සඳහා :-*
නීලා මහත්මිය, 077 4656121
ජුඩ් මහතා 077 6607653
කටාන විවිධ සේවා සමුපකාර සංගමය, දෙමන් හන්දිය.

11-159

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අඩ්ඩලච්චේනෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අඩ්ඩලච්චේනෙයි ප්‍රාදේශීය සභා බලසීමාව තුළ ඔළුවිල් පාරේ පිහිටි ඔළුවිල් තොඩ්ඩ පූමි නමැති ඉඩමට (අංක SMI/193A/2008 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 2 සහ 3 හි නැවත මැන ඒකාබද්ධ කිරීමක් වන) බලයලත් මිනින්දෝරු එස්. එම්. ඊබ්‍රාහිම් විසින් මැන සාදන ලද අංක SMI/99/2011 සහ 2011 ජූලි මස 28 වැනි දින දරන මානක පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල (මෙම දේපළ කල්මුණේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 105/101 සහ M 87/124 යටතේ ලියාපදිංචි කර ඇත.

ප්‍රමාණය (අ. 1, රූඩ් 1, පර්. 0.48) අක්කර එකයි රූඩ් එකකුත් පර්චස් බිංදුවයි දශම හතරයි අටක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සැම සියලු දේ සමග වේ.

ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. රකිබ් විසින් සහතික කරන ලද අංක 556 සහ 2011 නොවැම්බර් මස 22 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය මොහොමඩ් ස්මයිල් ජමල්ඩීන් උකස්කරු වශයෙන් කොළඹ 02, යුනියන් පෙදෙසේ අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම ජමල්ඩීන් මොහොමඩ් ෆාහිම් සහ මොහොමඩ් ස්මයිල් ජමල්ඩීන් ණයගැණුම්කරුවන් වශයෙන් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2014ක් වූ නොවැම්බර් මස 24 වැනි දින පෙ. ව. 10.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කල්මුණේ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ලඟ සිට අක්කරේයිපත්තු පාරේ කිලෝ මීටර් 14ක් පමණ ගියවිට ඔලුවිල් වරාය පිවිසුම් පාර හංදිය හමුවේ. එතැනින් වමට හැරී (SLPA) පාරේ මීටර් 600ක් පමණ ගියවිට අදාළ දේපළට පිවිසිය හැක. එම දේපළ පාරේ දකුණු පැත්තේ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව, නේෂ්න්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී අංක 46/58, නවම් මාවත, කොළඹ 02. දුරකථන අංක : 011 4218746

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, 3 වැනි මහල,
හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 077-3181891.

11-150

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු කළුතර තොටමුණේ මාලේවන්බද්දේ බේරුවල ප්‍රාදේශීය සභා බලසීමාව තුළ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 770 දරන කොටපිටිය ග්‍රාම නිලධාරී වසමේ කොටපිටිය ගමේ දංවත්තේගොඩ පිහිටි රුක්කත්තනගහලන්ද සහ රුක්කත්තනගහවත්ත නැගෙනහිර කොටස නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු කේ. කේ. කන්නන්ගර විසින් මැන සාදන ලද අංක 526/2002 සහ 2002 ජුනි මස 09 වැනිදින දරණ පිඹුර ප්‍රකාර කැබලි අංක 2ක් නැවත මැන බෙදීමක්) වන බලයලත් මිනින්දෝරු ඩී. පී. මිල්ලවිතානාච්චි විසින් මැන සාදන ලද අංක 28/2012 සහ 2012 ජූලි මස 15 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක ඒ දරන බෙදා වෙන් කළ බිම් කොටස (මෙම දේපළ කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 381/41 යටතේ ලියාපදිංචි කර ඇත)

ප්‍රමාණය (අ. 1, රූඩ් 0, පර්. 0.2) අක්කර එකකුත් පර්චස් බිංදුවයි දශම දෙකක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සියලු දේ සමග වේ.

තවද, ඉහත කී ඉඩමට අංක 526/2002 දරන පිඹුරේ නිරූපිත පාර සඳහා වෙන් කිරීම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. ජයකොඩි විසින් සහතික කරන ලද අංක 713 සහ 2012 ජූලි මස 26 වැනි දින දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද අංක 9527 සහ 2013 අප්‍රේල් මස 10 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙම ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය එරත්න කංකානමගේ දීපිකා කුමාරි උකස්කරු වශයෙන් කොළඹ 02 යුනියන් පෙදෙසේ අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම ඩිකී මොහාන් ලාල් ද සොයිසා අමරසේකර සහ එරත්න කංකානමගේ දීපිකා කුමාරි යන අය විසින් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2014ක් වූ නොවැම්බර් මස 28 වැනි දින පෙ. ව. 10.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - අළුත්ගම මතුගම ප්‍රධාන පාරේ ගමන් කර දර්ගා ටවුන් බසාර් පසුකළ විට කිලෝමීටර් 49 කණුව හමුවේ. ඊට මීටර් 100ක් පමණ මෙපිටින් දංවත්තගොඩ පාරට හැරී එම පාරේ මීටර් 800ක් පමණ ගොස් වමට හැරී අඩි 10-18ක් පළල බොරළු පාරේ ගමන්කළ විට කුඹුරක් හමු වේ. එම කුඹුරු අතුරින් ඉදිරියට ගියවිට අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී අංක 46/58, නවම් මාවත, කොළඹ 02. දුරකථන අංක : 011 4218746.

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණ සහ
දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, 3 වැනි මහල,
හල්ස්ඩ්‍රොෆ් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 077-3181891.

11-148

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව විකිණීම පිළිබඳ දැන්වීමයි

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ, නුගේගොඩ ගංගොඩවිල පිහිටි ජම්බුගස්මුල්ලේ 2 වැනි පටුමගේ වරිපනම් අංක 70/2 දරන හෙදවකගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සාදන ලද අංක 3609 සහ 1967 අප්‍රේල් මස 21 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 03 දරන බිම් කොටස (මෙම දේපළ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2003/169 සහ වෙළුම/පත්‍රුරුවේ ලියාපදිංචි කර ඇත.)

ප්‍රමාණය (අ. 0, රූඩ් 0, පර්. 7) පර්චස් හතක් විශාල ඉඩම් කැබැල්ල.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඩී. වීරක්කොඩි විසින් සහතික කරන ලද අංක 1865 සහ 2011 ජුනි මස 22 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය කොළඹ 02 යුනියන් පෙදෙසේ අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද සිරි ඉම්පෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් ලබා ගත් ණය පහසුකම් මත ලැබිය යුතු ගෙවීම පැහැර හැර ඇති හෙයින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2014ක් වූ නොවැම්බර් මස 28 වැනි දින ප. ව. 2.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ සිට නුගේගොඩ ගුවන් පාලම දක්වා ගොස් හයිලෙවල් පාරට පිවිස මීටර් 550ක් පමණ ගොස් වමට හැරුණු විට දෙවන පටුමග ජම්බුගස්මුල්ල පාර හමුවේ. එම පාරේ මීටර් 100ක් පමණ ගිය විට අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත. විකල්ප මාර්ගයක් ලෙස ජම්බුගස්මුල්ල පාරෙන් පිවිසිය හැක.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී අංක 46/58, නවම් මාවත, කොළඹ 02. දුරකථන අංක : 011 4218746.

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණ
සහ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, 3 වැනි මහල,
හල්ස්ඩ්‍රොෆ් වීදිය,
කොළඹ 12
දුරකථන අංක : 077-3181891.

11-149

---

## මහජන බැංකුව
(විශේෂ වත්කම් ඒකකය)

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ කොළඹ මහ නගර සභා සීමාවට අයත් තිඹිරිගස්යාය කොට්ඨාසයේ පිහිටි, අංක 90 (කොටසක්) ජාවත්ත පාර යන ලිපිනය දරන බලයලත් මිනින්දෝරු සී ද එස් ගුණතිලක විසින් සාදන ලද, 1972 නොවැම්බර් මස 20 වැනි දිනැති අංක 310 දරන පිඹුරේ ලොට් අංක 10 ලෙස දැක්වෙන බිම් කට්ටිය (බලයලත් මිනින්දෝරු ජේ. එල්. මාටන්ස්ටයින් විසින් සාදන ලද 1966 ජුලි මස 18 වැනි දිනැති අංක 506 දරන පිඹුරේ ලොට් අංක A, B, C, D, E, F, G සහ J ලෙස දැක්වෙන ඒකාබද්ධව පිහිටි බිම් කට්ටියන්ගේ කොටස් වෙන් කිරීමක් සහ නැවත මිනුමකි)

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 02 පර්. 2.0

ඉහත කී අංක 310 දරන පිඹුරට අනුව එහි පිහිටි වගාවන් ගොඩනැගිලි සහ සියල්ල සහිතව අංක ඒ 886/201 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ මහනගර සභා සීමාවට අයත් තිඹිරිගස්යාය, කොට්ඨාසයේ පිහිටි, අංක 90 (කොටසක්) ජාවත්ත පාර යන ලිපිනය දරන බලයලත් මිනින්දෝරු සී ද එස් ගුණතිලක විසින් සාදන ලද 1972 නොවැම්බර් මස 20 වැනි දිනැති අංක 310 දරන පිඹුරේ ලොට් අංක 07 ලෙස දැක්වෙන බිම් කට්ටිය (බලයලත් මිනින්දෝරු ජේ. එල්. මාටන්ස්ටයින් විසින් සාදන ලද 1966 ජුලි මස 18 වැනි දිනැති අංක 506 දරන පිඹුරේ ලොට් අංක A, B, C, D, E, F, G සහ J ලෙස දැක්වෙන ඒකාබද්ධව පිහිටි බිම් කට්ටියන්ගේ කොටස් වෙන්කිරීමක් සහ නැවත මිනුමකි)

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූ. 0 පර්. 2.25

ඉහත කී අංක 310 දරන පිඹුරට අනුව එහි පිහිටි වගාවන් ගොඩනැගිලි සහ සියල්ල සහිතව අංක ඒ 886/203 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2014 නොවැම්බර් මස 26 වැනි දින (බදාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම් සඳහා කරුණාකර 2002 නොවැම්බර් මස 15 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2002.10.31 දිනමිණ සහ 2002.10.30 සිලෝන් ඩේලි නිව්ස් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකරු - අයකරගැනීම්, විශේෂ වත්කම් ඒකකය, මහජන බැංකු ප්‍රධාන කාර්යාලය, (පළමු මහල), අංක 75, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 වෙත ගෙවිය යුතු වේ.

දුරකථන අංක : 011-2481668, 011-2481546, ෆැක්ස් 011- 2431033.

ඉහත කී ලිපිනයෙන් ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පිළිබඳ විස්තර ලබාගත හැක. ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,<br>
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,<br>
වසර 122 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*<br>
අංක 24, ටොරින්ටන් පාර,<br>
මහනුවර.<br>
දුරකථන අංකය : 081 - 2227593<br>
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371<br>
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*<br>
අංක 290, හැව්ලොක් පාර,<br>
කොළඹ 05<br>
දුරකථන අංක : 011-2502680, 2585408<br>
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176<br>
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

11-131

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරිය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 74146785 සහ 72619338.<br>
කැළණිවැලි ට්‍රේඩ් සෙන්ටර් ආයතනයට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.08.08 දිනැති අංක 1875 දරන *ගැසට් පත්‍රයේ* හා 2014 ජූලි 24 වැනි බ්‍රහස්පතින්දා දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදී ම 2014.11.29 වැනි දින පෙ. ව. 10.30 ට, කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**ඉහත සඳහන් උපලේඛනය**

1. ඉඩම් කැබැල්ල පිළිබඳ විස්තරය :

(අ) දිස්ත්‍රික්කය : කොළඹ
(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : හෝමාගම
(ඇ) ග්‍රාම නිලධාරී කොට්ඨාසය : 486 ඊ කටුවන
(ඈ) ගම හෝ නගරය : හෝමාගම
(ඉ) වරිපනම් අංකය :
(ඊ) බණ්ඩ සිතියම් අංකය : 520001
(උ) කොටස් අංකය : 0012
(ඌ) බිම් ප්‍රමාණය : හෙක්ටයාර 0.2022
(එ) උකසට යටත් බිම් ප්‍රමාණය : හෙක්ටයාර් 0.2022

2. පෙර ලියාපදිංචියේ යොමුව :

(අ) ලියාපදිංචි කළ ස්ථානය : හෝමාගම
(ආ) කොටස : G
(ඇ) වෙලුම් අංකය : 1411
(ඈ) පත්ඉරු අංකය : 283
(ඉ) හිමිකම් සහතික අංකය : 0004285
(ඊ) හිමිකමේ පන්තිය : පළමු පන්තිය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එල්. ජේ. බටගොඩ මිය,
කළමනාකරු.

ලංකා බැංකුව,
හෝමාගම.

11-166

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. වී. ආර්. පී. ආර්. පෙරේරා සහ ජේ. ඒ. එච්. ජයසිංහ.
ගිණුම් අංක : 0060 5000 3009.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2014 පෙබරවාරි මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් තුන් ලක්ෂ අසූ දෙදහස් හයසිය හතලිස් පහයි ශත දෙකක (රු. 5,382,645.02) මුදල ද 2014 පෙබරවාරි මස 10 වැනි දින සිට අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂයක (රු. 700,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයක් (19%) හා තවත් රුපියලක් තිස් හත් ලක්ෂ හැත්තෑ දෙදහස් තිස් හතයි ශත තුනක (රු. 3,772,037.03) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2014.04.25 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2014.04.16 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2014.11.26 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ මහර ප්‍රාදේශීය සභා සීමාවත් තුළ කිරිල්ලවල පිහිටි "මිල්ලගහවත්ත හි ලොට් ඊ" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ජී. ගුණතිලක යන අය විසින් සාදන ලද 2012 අප්‍රේල් මස 06 දාතම හා අංක 7852 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : මිහිඳු මාවත, ගිණිකොණට : අංක 24/2009 දරන පිඹුරේ ලොට් ඊ නිරිතට : අංක 24/2009 දරන පිඹුරේ ලොට් බී සහ වයඹට : අංක 6/1992 දරන පිඹුරේ ලොට් 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ නමයයි දශම පහයි හයක් (අ. 0 රූ. 0 පර්. 19.56) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 7852 දරන පිඹුරට අනුවය.

බලයලත් මානක තැන ආර්. හෙට්ටිආරච්චි යන අය විසින් සාදන ලද 2009 අප්‍රේල් මස 19 දාතම හා අංක 24/2009 දරන පිඹුරේ නිරූපිත ලොට් ඒ, තවත් අයුරකින් මෙහි පහත උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති බලයලත් මානක තැන ආර්. හෙට්ටිආරච්චි යන අය විසින් සාදන ලද 1992 පෙබරවාරි මස 14 දාතම හා අංක 6/1992 දරන පිඹුරේ නිරූපිත ලොට් 6 හි නැවත මිනුමක් හා උප බෙදුමක් වේ.

එකී කිරිල්ලවල පිහිටි "මිල්ලගහවත්ත හි ලොට් ඊ" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. හෙට්ටිආරච්චි යන අය විසින් සාදන ලද 1992 පෙබරවාරි මස 14 දාතම හා අංක 6/1992 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 6 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට මිහිඳු මාවත ගිණිකොණට ලොට් 7, නිරිතට : ඩබ්ලිව්. එස්. ආනන්ද ගුණසේකර යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ පාර සහ වයඹට : ලොට් 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හයයි දශම දෙකයි පහක් (අ. 0 රූ. 2 පර්. 6.25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 6/1992 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව සී 846/99 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 24/2009 දරන එකී පිඹුරේ ලොට් ඊ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

11-176/1

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ටී. එම්. එස්. බණ්ඩා,
ගිණුම් අංක : 0031 5001 0631.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013 සැප්තැම්බර් මස 26 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තිස් හත් ලක්ෂ තිස් අට දහස් එකසිය හතලිස් එකයි ශත විසි තුනක (රු. 3,738,141.23) මුදල ද 2013 අගෝස්තු මස 28 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් හතර ලක්ෂ විසි පන් දහස් හයසිය අසූ එකයි ශත අනූ පහක (රු. 3,425,681.95) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013.11.22 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2013.10.31 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිප්‍රවල පළකොට ඇති පරිදි 2014.11.27 වැනි දින පෙ. ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාවන් තුළ මොරටුවැල්ල පිහිටි ෆ්‍රේසර් ඇවනිව් වරිපනම් අංක 27 දරන "පයුරුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඕ. ජේ. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1991 ජූලි 26 දාතම හා අංක 3597 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ෆ්‍රේසර් ඇවනිව් නැගෙනහිරටː වරිපනම් අංක 25 දරන පරිශ්‍රයන් දකුණට : එම ඉඩමේ ලොට් 1 B සහ බස්නාහිරට : බලයලත් මානක තැන ටී. සී. ආර්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1969 මාර්තු මස 11 දාතම හා අංක 22 දරන පිඹුරේ ලොට් 3 හි මාර්ග පිවිසුම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හයයි පහක් (අ. 0 රූ. 0 පර්. 11.65) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3597 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව M 3126/01 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ඒ දිගේ ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ඉරුව M 915/52 යටතේ ලියාපදිංචි කොට ඇති හා බලයලත් මානක තැන ටී. සී. ආර්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1969 මාර්තු මස 11 දාතම හා අංක 22 දරන පිඹුරේ ලොට් 3,

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

11-176/2

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ටී. ජී. කේ. සුමිත්‍රාආරච්චි සහ එම්. එම්. එල්. පෙරේරා,
ගිණුම් අංක : 0061 5000 0260.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2012 පෙබරවාරි මස 29 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැට හත් ලක්ෂ තිස් තුන් දහස් පන්සිය හැට පහයි ශත විසි පහක (රු. 6,733,565.25) මුදල ද, 2011 අගෝස්තු මස 24 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් දෙලක්ෂ හැට හතර දහස් හාරසිය දහයයි ශත දහසයක (රු. 3,264,410.16) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) හා තවත් රුපියල් තිස් ලක්ෂ දහ හතර දහස් හතලිස් හයයි ශත හතලිස් නමයක (රු. 3,014,046.49) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2012.06.22 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2012.06.08 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2014.11.27 වැනි දින ප. ව. 2.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බත්තරමුල්ල පිහිටි දම්මෝදය මාවත වරිපනම් අංක 25/7, 25/7 A සහ 25/7 B (කොටසක්) දරන "මදටියගහවත්ත නොහොත් බිලිබානතුඩු කනත්තේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සී. ද එස්. ගුණතිලක යන අය විසින් සාදන ලද 2003 ජූලි මස 03 දාතම හා අංක 3126 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 3 නැගෙනහිරට : එම ඉඩමේ ලොට් A 3 දකුණට : පාර සහ බස්නාහිරටː ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 14.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග එකී අංක 3126 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව G 1466/247 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

එකී අංක 3126 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 3 (අඩි 2 පළල පාර සඳහා වෙන් කිරීම)

බලයලත් මානක තැන එම්. .බී. ද සිල්වා යන අය විසින් සාදන ලද අංක 9567 දරන පිඹුරේ නිරූපිත ලොට් E (අඩි 8 පළළ පාර සඳහා වෙන්කිරීම)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-176/3

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

රත්නාලෝක ඉන්ටර්නැෂනල් හි එකම අයිතිකරු සරත් රත්නායක,
ගිණුම් අංක : 0006 5005 0975 සහ 0006 1000 8992.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013 ඔක්තෝබර් මස 31 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැට එක් ලක්ෂ එක් දහස් එකසිය විස්සක (රු. 6,101,120) මුදල ද 2013 ජූලි මස 26 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසිපන් ලක්ෂ තිස් තුන් දහස් හයසිය හැට හතරයි ශත හැත්තෑ පහක (රු. 2,533,664.75) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%) රුපියල් හත් ලක්ෂ දාහත් දහස් පහයි ශත තිහක (රු. 717,005.30) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතක් (17%) රුපියල් තුන් ලක්ෂ හැත්තෑ පන් දහස් තුන්සිය දෙකයි ශත නමයක (රු. 375,302.09) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) හා තවත් රුපියල් පහළොස් ලක්ෂයක (රු. 1,500,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013.12.13 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2013.11.29 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2014.12.03 වැනි දින පෙ. ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩ විල්ලි හත්පත්තුවේ, තිරගන්දහය කෝරළේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුණෑගල නගරයේ උතුර 831 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කුරුණෑගල මහ නගර සභා සීමාවන් තුළ යන්තම්පලාව ග්‍රාමයේ, වෝඩ් අංක 02 හි, වැලැන්ගොල්ලවත්ත 1 වන පටුමගේ හි පිහිටි වරිපනම් අංක 37 දරන "වැලැන්ගොල්ල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සරත් වෙලගෙදර යන අය විසින් සාදන ලද 2001 ජනවාරි මස 22 වැනි දාතම හා අංක 3723 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එන්. එම්. සෝමදාස යන අයට අයිති ඉඩම නැගෙනහිරට : මාලනි රත්නායක අය අයට අයිති ඉඩම දකුණට : විමලසිරි යන අයට අයිති ඉඩම සහ බස්නාහිරට : වැලැන්ගොල්ල 1 වන පටුමග (මහ නගර සභා පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් තුනයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 33.1) හෝ හෙක්ටයාර් 0.0837 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3723 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී වැලැන්ගොල්ලවත්ත 1 වන පටුමගේ හි පිහිටි වරිපනම් අංක 37 දරන "වැලැන්ගොල්ල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩී. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1960 දෙසැම්බර් මස 07, 08, 09 සහ 10 දාතම හා අංක 231 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 18 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 19 නැගෙනහිරට : ලොට් 07 දකුණට : ලොට් 17 සහ බස්නාහිරට : පාර සඳහා වෙන්කිරීම (අඩි 20 පළල) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් තුනයි දශම එකක් (අ. 0, රූ. 0 පර්. 33.1) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 231 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 1694/239 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

11-176/4

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ටී. එම්. කේ. පෙරේරා
ගිණුම් අංක : 1026 5000 5306.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 ක් වූ පෙබරවාරි මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පහලොස් ලක්ෂ හතලිස් නම දහස් දෙසිය අනූ දෙකයි ශත එකක (රු. 1,549,292.01) මුදල ද 2007 සැප්තැම්බර් මස 25 වැනි දින

සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දාහතර ලක්ෂ විසි හත් දහස් නමසිය තිස් අටයි ශත අනූ නමයක (රු. 1, 427,938.99) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතරක් (14%) බැගින් වූ පොළියද හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2009.08.21 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2009.08.12 වැනි දින "දිවයින" "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2014.11.27 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, අධිකාරි පත්තුවේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බොල්ගොඩ පිහිටි " ගොරකගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. පී. ඒ. ජයවික්‍රම යන අය විසින් සාදන ලද 2001 ජුනි 17 දාතම හා අංක 8275 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් බී 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට: එම්. කරුණාපාල සහ වෙනත් අය දැන් සුමිත් සිල්වා යන අය විසින් හිමිකම් කියනු ලබන ගොරකගහවත්ත නැගෙනහිරට : එම්. ඩබ්ලිව්. බෙන්ට් පීරිස් සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන තෙක්කගහකුඹුර සහ මාලනී අතුකෝරල ලියනගේ යන අයගේ තේක්කගහවත්ත, දකුණට: අංක 1392 දරන පිඹුරේ ලොට් බී 2 සහ බී 7 (අඩි 12 පළල මාර්ග වෙන්කිරීම) සහ බස්නාහිරට : එම ඉඩමේ කොටසක් (අංක 2050 දරන පිඹුරේ ලොට් සී) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අක්. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 8275 දරන පිඹුරට අනුවය.

පිඹුරු අංක 8275 දරන පිඹුරේ එකී ලොට් බී 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී බොල්ගොඩ පිහිටි " ගොරකගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එල්. ගුණසේකර යන අය විසින් සාදන ලද 1985 දෙසැම්බර් මස 02 දාතම හා අංක 1392 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් බී 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම්. කරුණාපාල සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ගොරකගහවත්ත, නැගෙනහිරට : එම්. ඩබ්ලිව්. බෙන්ට් පීරිස් සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන තෙක්කගහකුඹුර සහ එම්. ඒ. ලියනගේ යන අයගේ තේක්කගහවත්ත දකුණට : ලොට් බී 2 සහ බී 7 සහ බස්නාහිරට : එම ඉඩමේ කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අක්. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ එකී අංක 1392 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව බී 165/60 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දැ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

එකී අංක 1392 දරන පිඹුරේ නිරූපිත ලොට් බී 7.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-176/5

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

පී. ඩී. ජයමාන්න/යූ. ජී. සී. ඩී. කරුණාරත්න.
ගිණුම් අංක : 0054 5000 0185.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 අගෝස්තු මස 04 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දාහත් ලක්ෂ හාර දහස් හත්සිය අසූ දෙකයි ශත දහ නමයක (රු. 1,704,782.19) මුදල ද 2010 මැයි මස 14 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහතුන් ලක්ෂ පනස් හත් දහස් පන්සිය හතලිස් හතයි ශත හතලිස් එකක (රු. 1,357, 547.41) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) හා තවත් රුපියල් දෙලක්ෂ තිස් දහසක (රු. 230,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2010.09.17 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2010.09.03 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ " අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2014.11.28 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු ගුවට් හතර වටරුක ග්‍රාමයේ පිහිටි "වටරුක එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 1999.03.03 දාතම හා අංක 46/1999 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 109 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට: මුල් පදිංචි කරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : ලොට් 2 A හි ලොට් 2 D දකුණට : එම ඉඩමේ ලොට් 108 සහ ලොට් 56 (මාර්ග පිවිසුම) සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 110 සහ ලොට් 56 (මාර්ග පිවිසුම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.30) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙන්ම පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ සමග එකී අංක 46/1999 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 593/213 යටතේ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී වටරුක ග්‍රාමයේ පිහිටි "වටරුක එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට එකී අංක 46/1999 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 110 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 111 සහ මුල් පදිංචිකරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : මුල් පදිංචිකරුවන් විසින් හිමිකම් කියනු ලබන

ඉඩම සහ එම ඉඩමේ ලොට් 109 දකුණට : එම ඉඩමේ ලොට් 109 සහ 56 සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 111 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම බිංදුවයි හතරක් (අ. 0, රූ. 0, පර්. 10.04) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙන්ම පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ සමග එකී අංක 46/1999 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රරුව A 593/214 යටතේ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 46/1999 දරන පිඹුරේ නිරූපිත ලොට් 13 සහ ලොට් 56 දිගේ, ඒ මතින් ගමන් කිරීමේ මා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-176/6

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති *උපලේඛනයේ* දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| නොවැම්බර් | 2014.11.07 | සිකුරාදා | 2014.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.11.14 | සිකුරාදා | 2014.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.11.21 | සිකුරාදා | 2014.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.11.28 | සිකුරාදා | 2014.11.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2014.12.05 | සිකුරාදා | 2014.11.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.12 | සිකුරාදා | 2014.11.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.19 | සිකුරාදා | 2014.12.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.26 | සිකුරාදා | 2014.12.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2015** | | | |
| ජනවාරි | 2015.01.02 | සිකුරාදා | 2014.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.09 | සිකුරාදා | 2014.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.16 | සිකුරාදා | 2015.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.23 | සිකුරාදා | 2015.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.30 | සිකුරාදා | 2015.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.